**පොල් සංවර්ධන අධිකාරිය - 2023**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පොල් සංවර්ධන අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ , 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 48 ඡේදය අනුව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවද, රු.35,678,720 ක කෙටිකාලීන වෙන්කිරීම් ශේෂය තුළ රු.14,485,589 ක හර ශේෂයක්ද ඇතුළත් වී තිබීම නිසා කෙටි කාලීන වෙන්කිරීම් ශේෂය රු.21193131 ක් ලෙස රු.14485589 ක් අඩුවෙන් වාර්තා වී තිබුණි. | මුදල් අය කිරිමේ සහ ඉන්වොයිස් පත් නිකුත් කිරීම් සඳහා නිසි ක්‍රම වේදයක් නොතිබීම මත මෙම හදුනා නොගත් මුදල් ශේෂ මුල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පෙන්වීමට සිදු වී ඇත . | ප්‍රමිතිය ප්‍රකාරව වත්කම් හා වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙන වෙනම දැක්විය යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)පොල් සංවර්ධන අධිකාරිය සතු දුන්කන්නාව වත්තේ භාවිතයට ගන්නා වත්කම් අයිතම 101ක වටිනාකම ගණනය කර දේපළ පිරියත යටතේ ගිණුම් ගත කර නොතිබුණි. | දුන්කන්නාව වත්ත විසින් භාවිතයට ගන්නා දේපළ පිරියත උපකරණ අයිතම 101 ක් සඳහා වටිනාකම දේපළ පිරියත උපකරණ ලේඛනය 2024 වත්කම් සමීක්ෂණයෙන් පසුව අදාළ වත්කම් තීරණය කර ලේඛනයට ඇතුළත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත. | අධිකාරියට අයිති වත්කම් නිවැරදිව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ)අධිකාරියේ කොටුව කාර්යාලයේ ස්ථාපිත කර ඇති ව්‍යාපාරික සේවා මධ්‍යස්ථානයට සමාගම් 7කින් රු.4,869,826 ක් වටිනා වත්කම් පරිත්‍යාග ලෙස 2023 වර්ෂයේදී ලැබී තිබුණද එම වත්කම් ගිණුම් ගතකර නොතිබුණි . | ව්‍යාපාරික සේවා මධ්‍යස්ථානය ඉදි කිරීම් වැඩිදියුණු කිරීම් සඳහා පරිත්‍යාග ලෙස ලැබී ඇති භාණ්ඩ සඳහා අදාල ප්‍රදානයන් සිදුකළ කර්මාන්තකරුවන්ගෙන් ලිඛිත තහවුරු ලබාගැනීමට සහ ඉන්වෙන්ට්‍රියට ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත. | අධිකාරියට ප්‍රදාන ලෙස ලැබෙන වත්කම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)අපනයනකරුවන්ගේ ලියාපදිංචි ගාස්තු හා අලෙවිකරණ අංශයේ ආදායම රු.28,305,500 ක් වුවද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ එම ආදායම රු.34,970,431 ක් වූයෙන් රු.6,664,931 ක වෙනසක් ද අපනයන සේවා ගාස්තු ආදායම රු.269,307,360 ක් වුවද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ එම ආදායම රු.268,180,717ක් ද වූයෙන් රු.1,126,643 ක වෙනසක් ද විය. | 2022 වර්ෂයේ හඳුනා නොගත් අයිතම යටතේ දක්වන ලද රු.මිලියන 6 ක ශේෂයෙන් 2023 වර්ෂයට අදාළ ආදායම් ගිණුම්වලට බැර කිරීම හේතුවෙන් මෙම වෙනස සිදුවී ඇත. හඳුනා නොගත් තැන්පතු නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | සමාලෝචිත වර්ෂයට අදාළ ලියාපදිංචි ගාස්තු හා අපනයන සේවා ආදායම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඈ)2023 දෙසැම්බර් 31දිනට අධිකාරියේ හඳුනානොගත් බැර ශේෂ රු.8,018,127 ක් හා හඳුනා නොගත් හර ශේෂ රු.5,184,737 ක් පැවතියද එම අගයන් වෙන වෙනම ගිණුම් ගත නොකර එහි ශුද්ධ අගය වූ රු.2,833,390 ක් හඳුනා නොගත් බැර ශේෂ ලෙස ජංගම වගකීම් යටතේ ගිණුම් ගත කර තිබුණි. | මුදල් අය කිරීමේ සහ ඉන්වොයිස් පත් නිකුත් කිරීම සඳහා නිසි ක්‍රම වේදයක් නොතිබීම මත මෙම හඳුනා නොගත් මුදල් ශේෂ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පෙන්වීමට සිදු වී ඇත. | හඳුනා නොගත් හර හා බැර ශේෂ හඳුනාගෙන එම අගයන් වෙන වෙනම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඉ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.170,788,322 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සමුච්චිත අරමුදලට රු.167,993,514 ක් බැර කර තිබුණු බැවින් සමුච්චිත අරමුදල රු.2,794,808 කින් අවප්‍රමාණ වී තිබුණි. | සමුච්චිත අරමුදල රු.2,794,808 කින් අවප්‍රමාණය වී ඇති බවට අධිකාරියේ සභාපතිවරයා එකඟ වී ඇත. | සමාලෝචිත වර්ෂයේ අතිරික්තය මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්විය යුතුය. |
| (ඊ)රාජ්‍ය සමාගමකට අධිකාරිය විසින් ලබාදුන් රු.58,265,037ක ණය මුදල එම සමාගමෙන් සෘජුවම මුදල් අමාත්‍යාංශය වෙත නැවත ගෙවීම් කර තිබුණි. එම ණය නිරවුල් කිරීම ගිණුම් තැබීමේදී එම මුදල අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ ආදායමට හර කිරීම නිසා අතිරික්තය එම ප්‍රමාණයෙන් අවප්‍රමාණය වී තිබුණි. | ණය නිරවුල් කිරීම ගිණුම් තැබීම සමාලෝචිත වර්ෂයේ ආදායමෙන් ගැලපීමක් සිදුකර නොමැත. සමාලෝචිත වර්ෂයේ ආදායමෙන් ගැලපීම සිදුකර ඇත්තේ 2023 වසරේ අධිකාරිය විසින් මහ භාණ්ඩාගාරය වෙත සිදුකරන ඉපැයුම් (Profit - Levi ) බැර කිරීම වේ. අධිකාරිය සතු මුදලින් චෙක් පතක් නිකුත් කිරීම වෙනුවට, එම මුදල සෘජුවම මහ භාණ්ඩාගාරය වෙත බැර කිරීම මත මෙය සිදු වී ඇත. | ලැබිය යුතු ණය නිරවුල් කිරීම නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (උ)සමාලෝචිත වර්ෂයේ භාවිතයෙන් ඉවත්කළ රසායනාගාර උපකරණවල හා ලී බඩු හා සවිකිරීම්වල පිරිවැය පිළිවෙලින් රු.51,113 ක් වැඩියෙන් හා රු. 35,190 ක් අඩුවෙන් ගිණුම් ගත වී තිබුණු බැවින් ජංගම නොවන වත්කම් හා වෙනත් ආදායම් රු.15,923 කින් අවප්‍රමාණය වී තිබුණි. | 2023.12.31 දිනට මෙම ගණනය කිරීම මගහැරී ඇති අතර, 2024 වර්ෂයේ මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | භාවිතයෙන් ඉවත් කරන වත්කම්වල පිරිවැය හඳුනාගෙන එම වටිනාකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්වියයුතුය. |

| | | |
|---|---|---|
| (ඌ)කප්රුක ජය ඉසුර ණය යෝජනා ක්‍රමය යටතේ ලබාදුන් ණය වලින් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.213,365,980 කින් කෙටිකාලීනව අයවිය යුතු ණය කොටස ජංගම වත්කම් ලෙස වර්ගීකරණය නොකර මුළු වටිනාකමම ජංගම නොවන වත්කම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | ඉදිරි වසර 1 සිට 7 දක්වා කාල පරාසයක් තුල අධිකාරියට අයවිය යුතු මුදල 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කිරීමට නියමිත අවසාන ගිණුම් වාර්තාවේ සිට ඉදිරියට වසරක් තුල අය විය යුතු ණය වාරික අදාළ ජංගම වත්කම් ලෙසත්, ඉතිරි මුදල ජංගම නොවන වත්කම් ලෙසත්, ගිණුම් ගත කිරිමට පියවර ගෙන ඇත | ණය කාල සීමාව අනුව ණය ශේෂ ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණය කර දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (එ)1993 වර්ෂයේදී අධිකාරියේ සේවය කල ගණකාධිකාරිවරයකු විසින් සිදුකළ රු.2,000,000 ක හා රු.434,688 ක වංචාවක් වෙනුවෙන් එම නිලධාරියා විසින් ආයතනයට පළමු වංචා කළ මුදලට රු.2,500,000 ක් ගෙවීම් කර ඉතිරි මුදලට පොලියක් එකතු කර රු.1,871,776 ක් අධිකාරියට ලැබිය යුතු ලෙස ගිණුම් ගතකර ඉන් රු.543,360 ක් පමණක් 2022 වර්ෂය අවසානයට අයකරගෙන තිබුණි. ඉතිරි රු.1,328,415 ක මුදල කිසිදු අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ගිණුම්වලින් කපාහැරීමට කටයුතු කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් ගිණුම් තුළින් හෙළිදරව් කිරීම්ද සිදුකර නොතිබුණි. | 2014.11.11 දිනැති 521.13 දරන මණ්ඩලීය පත්‍රිකාවට අනුව මෝල් අංක 68, 81 සහ 344 දරන මණ්ඩලීය පත්‍රිකා අනුව මෝල් අංක128 නාම ලේඛනයෙන් ඉවත්කිරීමට අනුමැතිය ලබාදී ඇත . එහෙත් මුදල් අවභාවිතා කරන ලද මෙම මෝල් තුන සම්බන්ධ ගැටලුව නිමවන තෙක් පොත්වලින් ඉවත්කිරීමට පියවර ගෙන නොතිබුන අතර 2023 වසරේ පොත්වලින් ඉවත් කිරීමට පියවර ගෙන ඇත. | විධිමත් අනුමැතියක් මත අයවිය යුතු ශේෂ කපා හැරීමට කටයුතු කර ගිණුම්වල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු යුතුය. |

### 1.6 නීති, රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 33 (4) වගන්තිය | පොල් පිළිබඳ සෙස් බද්ද පැනවීම, අය කර ගැනීම, ක්‍රියාත්මක කිරීම හා ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය සියළු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය යුතු වුවද අධිකාරිය විසින් ඒ සම්බන්ධයෙන් කිසිදු නියෝගයක් සකස් කර නොතිබුණි. එසේ වුවද 2007 වර්ෂය දක්වා මෝල් සංවර්ධන අරමුදලට සෙස් ආදායමින් හා ඊට පසු වර්ෂවලදී භාණ්ඩාගාර ප්‍රදානවලින් ලැබූ අපනයනය කරන සෑම කි. ග්‍රෑ 1 කට ශත 20 බැගින් වූ මුදලක් යොදා ගනිමින් අපනයනය කරන මෝල් හිමියන් | 2023 වසරේ මෝල් හිමියන්ගේ ඇප තැම්පත් මුදලින් රු.2,471,259 ක් නිදහස්කර ඇති අතර ආදායමින් කිසිදු මුදලක් නිදහස් කර නොමැත. ඉතිරි ඇප තැම්පත් ගිනුමහි ඇති ශේෂයන් අනුමත ක්‍රියාකාරකම් සඳහා සක්‍රිය දිසිදි මෝල්හි ඉල්ලිමමත නිදහස්කරනු ඇත. | අයකරගනු ලබන සෙස් බද්දේ ක්‍රියාකාරකම් පිළිබඳ අධිකාරිය විසින් නියෝග සකස් කර නිසි අනුමැතිය මත එම නියෝග ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නමින් ගිණුම් පවත්වාගෙන ගොස් තබූ අතර වර්ෂය අවසානයේ ගිණුම් 58 ක රු.44,000,497 ක ශේෂයක් විය. 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා එම ගිණුම් වලින් රු.11,814,955 ක මුදලක් අදාළ මෝල් හිමියන් වෙත ආපසු ගෙවා තිබුණි. | | |
| (ආ) 1975 අංක 24 දරන පනතින් සංශෝධිත 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 51 වගන්තිය හා 1979 දෙසැම්බර් 31 දිනැති අංක 69/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළමු වන උපලේඛන යේ 3 වන ඡේදය | අපනයනය කරනු ලබන පොල් නිෂ්පාදනවල ගුණාත්මක ප්‍රමිති නියම කිරීම හා පවත්වාගෙන යාම අධිකාරිය විසින් කළ යුතු වුවද 2023 වර්ෂයේදී ඇ.එ.ජ .ඩොලර් 277,510 ක් වූ පොල් ආශ්‍රිත නිෂ්පාදන (දිසිදි පොල් හැර) මෙ.ටො .172,685 ක් අපනයනය කර තිබුණද ඒ පිළිබඳ කිසිදු තත්ත්ව පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | මුල් කාලීනව ලොව පිළිගත් නියාමන හා නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කරනු ලැබූ ක්‍රමවේදය නිෂ්පාදන සහතිකකරණයයි. මෙහිදී නිෂ්පාදනවල නියැදි ලබාගෙන ඒවා විශ්ලේෂණය කිරීම මගින් සමස්ථ නිෂ්පාදනය පිළිබඳ තීරණ ලබාගන්නා ලදි. නමුත් වේගයෙන් දියුණුවෙන තාක්ෂණයික ක්‍රමවේදයන් හා දැනුම හමුවේ නිෂ්පාදනයක ගුණාත්මකභාවය තීරණය කිරීම අදාළ පද්ධතිවල සහතිකකරණය මගින් සිදුවන බව පිළිගෙන ඇත. මෙහිදී නිෂ්පාදන නොව. අදාළ නිෂ්පාදන පද්ධතිය සහතිකකරණය කිරීමට ලක් කිරීම සිදු කරයි. මෙම පද්ධති සහතිකකරණය හරහා, නිෂ්පාදන ක්‍රියාවලියේදී නිෂ්පාදනවල ගුණාත්මකභාවයට හානිවිය හැකි සියලු තත්ත්වයන් වැළැක්වීම හෝ පාලනය කිරීම සිදු කරන බැවින් සමස්ථ නිෂ්පාදනයේම ගුණාත්මකභාවය ආරක්ෂා වනු ඇත. | අධිකාරිය විසින් අපනයනය කරනු ලබන පොල් නිෂ්පාදනවල ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රමිති සකස් කිරීම, පවත්වාගෙන යාම හා අධීක්ෂණය සිදුකළ යුතුය. |
| (ඇ) 1987 දෙසැම්බර් 10 දිනැති අංක පොසංඅ/දි පො/මෝ/87/ 15 දරන අභ්‍යන්තර | දිසිදි පොල් නිෂ්පාදනයන් පරීක්ෂා කිරීම, ආදර්ශ ගැනීම, තත්ත්වය සහතික කිරීම හා අපනයනය කිරීමට අදාළව ඇමරිකා එක්සත් ජනපදය ,කැනඩාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය වැනි විශේෂ වෙළඳපලවල් සඳහා අපනයනය | 1987 වර්ෂය අයත් වකවානුවේදී අදාල රටවල ගැනුම්කරුවන්ගේ අවශ්‍යතාවය පරිදි මෙම පරීක්ෂා කිරීමේදී ආදර්ශ ලබාගත යුතු පදනම තීරණය කර ඇත. මේ වන විට වඩාත් | අධිකාරිය නිකුත් කරනු ලබන අභ්‍යන්තර චක්‍රලේඛවලට අනුකූල විය යුතු අතර අවශ්‍යතාවය මත චක්‍රලේඛ සංශෝධනය කර අනුමත කරවා |

| | | | |
|---|---|---|---|
| චක්‍රලේඛයෙහි 3 හා 4 වගන්ති | කරන්නා වූ දිසිදි පොල් නිෂ්පාදනයන් පරීක්ෂා කිරීමට දෛනික නිෂ්පාදනයෙන් සියයට 25ක ආදර්ශ එකතු කිරීමත් එසේ එකතු කරනු ලබන ආදර්ශ ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර වලට අනුකූල දැයි පරීක්ෂා කිරීමත් සිදු කළ යුතු වුවද 2023 වර්ෂය තුළදී දිසිදි පොල් මෙ.ටො 5,082ක් එම රටවලට අපනයනය කර තිබුණද පරීක්ෂා කිරීම සඳහා ආදර්ශ එකතු කිරීම සියයට 10ක් පමණක් සිදු කර තිබුණි. | පිළිගත් ක්‍රමවේදය වන්නේ නිෂ්පාදන සහතිකකරණය නොව අදාළ පද්ධතිවල සහතිකකරණය බැවින් එම රටවලින් එවැනි පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවයන් මතු වී නැත. පොල් සංවර්ධන අධිකාරිය විසින් සියලුම දිසිදි පොල් කර්මාන්ත සඳහා පද්ධති සහතිකකරණය අනිවාර්ය කර ඇති බැවින්, දිගින් දිගටම 25 % පදනමින් ආදර්ශ ලබාගෙන පරීක්ෂා කිරීම්වලට යොමුකර නැත.<br>කෙසේ වෙතත්, මීට අවුරුදු 40 කට ආසන්න කාලයකට පෙර පනවන ලද චක්‍රලේඛ වර්තමානයට ගැලපෙන පරිදි වෙනස් කිරීම 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට එක්කර ඇත. | ගැනීමද සිදු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 170.79 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 98,651,996 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 72,136,326 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පරීක්ෂණාගාර අදායම, නැවුම් පොල් ක්ෂේත්‍ර පරීක්ෂණ හා සැකසුම් ගාස්තු ආදායම, තැඹිලි ක්ෂේත්‍ර පරීක්ෂණය හා සැකසුම් ගාස්තු ආදායම හා ආයෝජන පොලී ආදායම පිළිවෙලින් රු.35,265,218 ක් රු.97,091,468 ක් රු.59,807,950 ක් හා රු.37,561,675 ක් ඉහළ යාමද සැකසුම් සංවර්ධන අංශයේ ප්‍රාග්ධන සංවර්ධන වියදම් රු.11,813,364 කින් අඩුවීමද මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී පුනරාවර්තන ප්‍රදාන සියයට 35 කින් අඩු වී තිබූ අතර ලියාපදිංචි ගාස්තු ආදායම, සියයට 24.56 කින් වැඩි වී තිබුණි. එසේම නැවුම් පොල් සඳහා වන පරීක්ෂණ සැකසුම් ගාස්තු හා තැඹිලි සඳහා වන පරීක්ෂණ සැකසුම් ගාස්තු සියයට 228 කින් හා සියයට 86 කින් වැඩි වී තිබුණි. බහාලුම් පරීක්ෂණ ගාස්තු ආදායම සියයට 31 කින් අඩු වී තිබූ අතර පොල් ආදායම සියයට 34 කින් වැඩි වී තිබුණි. මෙහෙයුම් වියදම සියයට 17 කින් ඉහළ ගොස් තිබූ අතර සැකසුම් හා සංවර්ධන අංශය හා අළෙවිකරණ පර්යේෂණ හා සංවර්ධන අංශයන්හි ප්‍රාග්ධන හා සංවර්ධන වියදම් පිළිවෙලින් සියයට 56 ක අඩුවීමත් හා සියයට 96 ක වැඩිවීමක් සිදුවී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික වත්කම් අනුපාතයන් 5:1 ක් හා 5:1ක් වූ අතර පසුගිය වර්ෂයේදී එම අනුපාතයන් 6:1 ක් හා 6:1 ක් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දුන්කන්නාව වත්තේ 2021, 2022, 2023 වර්ෂයන්හි පොල් ඵලදාව පිළිවෙලින් 72,460 ක් 65,365 ක් හා 57,289 විය. මේ අනුව වාර්ෂික පොල් ඵලදාව සැලකිය යුතු මට්ටමින් අඩුවෙමින් පවතින බව නිරීක්ෂණය වූ අතර 2021 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 21 ක පමණ ඵලදාව අඩුවීමක් නිරීක්ෂණය විය. | පොල් අස්වැන්න වර්ෂයෙන් වර්ෂයට විචලනය වේ. දේශගුණික සාධක හා පොහොර භාවිතය පොල් අස්වැන්නට ඍජුව බලපායි. පොල් පර්යේෂණ ආයතනයේ වාර්ෂික දත්ත වලට අනුව, සමස්තයක් ලෙස ලංකාවේ පොල් අස්වැන්න 2021,2022,2023 වර්ෂවලදී ක්‍රමයෙන් අඩුවී ඇත. | පොල් ඵලදාව වර්ධනය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අධිකාරිය විසින් ගත යුතුය. |
| (ආ) “පොල් නිෂ්පාදන විශාල තොග වශයෙන් මිලදීගෙන මිල අඩු වැඩි වීම අනුව වෙළඳපලට නිකුත් කිරීම මගින් මිල පාලනය කිරීම” අරමුණ කරගනිමින් ආරම්භ කර තිබූ පොල් තෙල් මිල ස්ථායීකරන අරමුදලෙහි කටයුතු වසර 37ක පමණ කාලයක සිට අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග නොගෙන තිබුණි. | මෙම අරමුදලේ පවතින මුදල් පොල් කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා කර්මාන්තකරුවන්ට මූල්‍ය පහසුකම් සැපයීමට ණය යෝජනා ක්‍රම දෙකකට යෙදවීමට කටයුතු කර ඇත. එම ණය මුදල් අවශ්‍යතාවය පරිදි නිදහස් කරන තෙක් මෙසේ ආයෝජනය කිරීම් සිදුකර ඇත. | අරමුදලේ අරමුණු ඉටුකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඇ)අධිකාරිය විසින් පොල්තෙල් නිෂ්පාදකයන්ගේ පොල්තෙල් නිෂ්පාදන තුළ ඇෆ්ලටොක්සින් නොමැති බවටත් , කිසිදු රසායනික ද්‍රව්‍යයක් දැමීමෙන් තොරව ස්වභාවික ලෙස නිෂ්පාදනය වන බවත් සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියම ප්‍රමිතියෙන් යුතුව සිදුවන බවටත් පරීක්ෂාවන් සිදුකර ලබාදෙනු ලබන තරු 5 සහතික 25ක් 2022 වර්ෂයේදී පොල් ආශ්‍රිත නිෂ්පාදන ආයතන 11ක් විසින් ලබාගෙන තිබුණ ද 2022 වර්ෂයේ දී තරු 5 සහතික 7ක් ලබාගෙන තිබූ ආයතන 2023 වර්ෂයේ දී තරු 5 සහතික 3ක් පමණක් ලබාගෙන තිබුණි. මේ අනුව උසස් තත්ත්වයේ පොල් තෙල් නිෂ්පාදනකරුවන් ඔවුන්ගේ නිෂ්පාදනවල තත්ත්වය උසස් කරලීමට ඇති උනන්දුව අඩුවෙමින් පවතින බව නිරීක්ෂණය විය. | තරු පහ ලාංඡනය සහිත ගුණත්වයෙන් යුතු පොල්තෙල් නිෂ්පාදනය කරන ලද කර්මාන්ත කරුවන් විසින්, ගුණත්වයෙන් යුතු පොල්තෙල් නිෂ්පාදනය කර වැඩි මිලකට වෙළඳපොලට නිකුත් කරනු ලබයි. 2022-2023 වර්ෂයේ පැවති ආර්ථික අර්බුදය හමුවේ පාරිභෝගිකයා වෙලදපොලේ මිල අඩු පොල්තෙල් නිෂ්පාදන පමණක් මිලදී ගැනීම හේතුවෙන් තරු පහ ලාංජනය සහිත පොල්තෙල් නිෂ්පාදනය කරන කර්මාන්ත කරුවන් විසින් එම පොල්තෙල් නිෂ්පාදනය තාවකාලිකව නතර කර, තරුපහ රහිත පොල්තෙල් නිෂ්පාදනය කිරීමට පෙළඹී ඇත. එම තත්ත්වය යටතේ පොල්තෙල් සාම්පල පරීක්ෂා කිරීම තාවකාලිකව නවතා ඇත. | අධිකාරිය විසින් පොල් තෙල් නිෂ්පාදකයින්ට මූල්‍යමය සහාය, දැනුම හා වෙනත් පහසුකම් ලබාදී ඔවුන්ගේ නිෂ්පාදන පිරිවැය අවම කිරීම තුළින් පාර්භෝගිකයන්ට ගුණාත්මක නිෂ්පාදනයන් දැරිය හැකි මිලකට ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ඇ)අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී දේශීය වෙළඳ පොලේ මිශ්‍ර පොල්තෙල් පරීක්ෂා කිරීම් 101ක් සිදුකර තිබුණු | 2023 වසරේ වෙළඳපොල පොල්තෙල් නියැදි පරීක්ෂා කිරීම් වලදී හඳුනාගත් අපගමනයන් මත | දේශීය වෙළඳපල තුළ සිදුකරන පරීක්ෂණ වැඩිකිරීම හා අපගමනයන් |

| | | |
|---|---|---|
| අතර එයින් අපගමනයන් 13ක් හඳුනාගෙන තිබුණද ඒ සම්බන්ධයෙන් අදාළ ආයතන වූ සෞඛ්‍ය අමාත්‍යාංශය හා පාරිභෝගික අධිකාරියට පැමිණිළි කිරීම හෝ දැනුවත් කිරීම සිදුකර නොතිබූ බැවින් එම පරීක්ෂාවන් ඵලදායක වී නොතිබුණි. | හඳුනාගත් වෙළඳසැල් හා හඳුනාගත් පොල්තෙල් නිෂ්පාදන ආයතන ක්ෂේත්‍ර නිලධාරීන් හරහා දැනුවත් කිරීම් සිදු කෙරිණි. නමුත් මෙහිදී මතුවූ ප්‍රධාන ගැටළුවක් වූයේ වෙළඳසැල් හඳුනාගත හැකි වුවත් පොල්තෙල් නිෂ්පාදන වැඩි වශයෙන් අතරමැදියන් හරහා වෙළඳසැල්හිමියන් මිලදීගනු ලබන බැවින් පොල්තෙල් නිෂ්පාදකයින් හඳුනා ගැනිමේ අපහසුතාවයයි. ක්ෂේත්‍ර නිලධාරීන් හරහා අතරමැදියන්ද දැනුවත් කළ අතර, වෙළඳසැල් හිමියන්ද උසස් තත්ත්වයෙන් යුතු පොල්තෙල් අළෙවි කිරීම සම්බන්ධව දැනුවත් කිරීම සිදුකර ඇත. | නිසි අධිකාරීන් වෙත වාර්තා කර ඒවා නිවැරදි කරවා ගැනීම තුළින් ගුණාත්වයෙන් ඉහළ නිෂ්පාදන පාරිභෝගිකයින් වෙත ලබා දීමේ වගකීම ඉටු කළ යුතුය. |
| (ඉ)2022 දෙසැම්බර් 27 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 609/අලෙවි/02 ප්‍රකාරව ලියාපදිංචිය ලබාගෙන නොමැති එක් අපනයනකරුවකුට අවස්ථා 03කදී පමණක් ලියාපදිංචිය සම්පූර්ණ කිරීමෙන් තොරව පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම සඳහා තාවකාලික අවසරපත් නිකුත් කිරීමට අනුමැතිය ලබා දී තිබුණි .එහෙත් සමාලෝචිත වර්ෂයේදී තාවකාලික අවසර පත් නිකුත් කල අපනයනකරුවන් 18 දෙනෙකුට ඉහත අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට පටහැනිව අතිරේක අපනයන අවස්ථා 1 ත් 5 ත් අතර ප්‍රමාණයකට අනුමැතිය දී තිබුණි. | අළෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයේ අදාළ වසරට අදාළ නිෂ්පාදන සඳහා වාර්ෂික ලියාපදිංචිය ලබාගෙන නොමැති අපනයනයන් ආරම්භ කිරීමට ප්‍රථම ඔවුන්ගේ නිෂ්පාදනවල සාම්පල ආනයනකරුවන් වෙත ලබාදී ඇණවුම් ලබාගැනීමට අදහස් කරන හෝ යම් අඩුපාඩු ඇති බැවින් නිෂ්පාදකයෙකු වශයෙන් ලියාපදිංචිය ලබාගැනීමට සැකසුම් සංවර්ධන අංශයට අයදුම් කර නොතිබූ ආයතන වෙත අළෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයෙන් එක් ආයතනයක් වෙනුවෙන් තාවකාලික අවසර පත් වසරකට 03 ක් නිකුත් කිරීමට මාණ්ඩලීය අනුමැතිය ලැබී ඇත. සිය අපනයනයන් වැඩිකර ගැනීමට සහ නව ගැනුම්කරුවන් හට දීර්ඝකාලීනව තම අපනයනයන් කෙරෙහි විශ්වාසනීයත්වය ඇති කර ගැනීම සඳහා දෘඩ සහ දැඩි නියාමන වලින් ඔබ්බට ගොස් අපනයනකරුවන් හට පහසුකම් සැපයීම අරමුණු කොට ගෙන අවසරපත් තුනකට වඩා ලබාදීමට පියවරගෙන ඇත. | වලංගු ලියාපදිංචියක් තුළින් විධිමත් හා ගුණාත්මක අපනයනයන් සඳහා අපනයනකරුවන්ව උනන්දු කළ යුතුය. |
| (ඊ)නව කර්මාන්තකරුවන් සඳහා ණය පහසුකම් ලබාදීමේදී අධිකාරිය විසින් බැංකුව වෙත නිර්දේශ ඉදිරිපත් කළ යුතු | 2023 වර්ෂයේ කප්රුක ජය ඉසුරු ණය යෝජනා ක්‍රමය සඳහා අයදුම්පත් පරීක්ෂා කිරීම සඳහා කමිටුවක් පත් | පොල් නිෂ්පාදනකරුවන් නිවැරදිව හඳුනාගෙන ණය පහසුකම් ලබාගැනීමට |

| | | |
|---|---|---|
| බැවින් නියැදි පරීක්ෂාවට අනුව ණය අයදුම්පත් නිර්දේශ කිරීම සඳහා දින 32 සිට දින 105 දක්වා කාලපරාසයක් ගත වී තිබුණු බැවින් ප්‍රතිලාභීන්ට ණය ලබා ගැනීමේ ප්‍රමාදයක් සිදුවන බව නිරීක්ෂණය විය. | කරන ලදි. ඒ අනුව ණය ලියාපදිංචිය සඳහා බැංකුව වෙතින් යොමුකරන ලද ලිපි එම කමිටුව වෙත යොමු කරන ලදි. කමිටු නිර්දේශය ලබාගත් සහ සමහර අයදුම්කරුවන් පිළිබඳව විපරම් වාර්තා ලබාගත් පසු නිර්දේශිත ලිපි බැංකුව වෙත යොමු කිරීම සිදු කර ඇත. | අදාළ නිර්දේශයන් අප්‍රමාදීව ලබා දිය යුතුය. |
| (උ)අධිකාරියේ කොටුව කාර්යාලයේ සැකසුම් අංශය ස්ථාපිත කර ඇති පළමු මහළේ වර්ග අඩි 1,183 ක ප්‍රමාණයක් හා තුන්වන මහලේ වර්ග අඩි 190 ක කාර්යාල පරිශ්‍ර කොටසක් භාවිතයකින් තොරව පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර 2023 වර්ෂයට සම්පූර්ණ ගොඩනැගිල්ලේ විදුලි වියදම රු.2,176,119 ක් වූ බැවින් ඉන් රු.614,241 ක් හෙවත් සියයට 28 ක් ඌණ උපයෝජිතව පවතින බිම් මහලේ විදුලි වියදම වූ බැවින් එම වියදම අනාර්ථික වියදමක් බව විගණනයේදී නිරීක්ෂණය විය. | මෙම අධිකාරිය, එහි කාර්යය භාරය අනුව ප්‍රධාන අංශ 05 කින් සමන්විත අතර, ඉන් පොල් ආශ්‍රිත නිෂ්පාදනකරුවන් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවනේග් අවශ්‍යතා ඉටුකරලීමට වඩාත්ම දායක වන අළෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය හා සැකසුම් සංවර්ධන අංශය කොටුව කාර්යාලීය ගොඩනැගිල්ලේ ස්ථාපනය කර ඇත. ඊට අමතරව අභ්‍යන්තර විගණන අංශය හා පුස්තකාලයද මෙම ගොඩනැගිල්ලේ ස්ථාපනය කර ඇත. මෙම කාර්යාලීය ගොඩනැගිල්ලේ පළමු මහලේ ඇතිවූ ගිනි ගැනීමක් හේතුවෙන් එම මහල අළුත්වැඩියා කිරීමට සිදු ව අතර, එම අළුත්වැඩියාවන් නිමවීමෙන් පසු මේවන විට මෙම අධිකාරියේ සැකසුම් සංවර්ධන අංශය එම මහලේ ස්ථාපනය කර ඇත. | අධිකාරියේ කාර්යාල පරිශ්‍රයන් උපරිම ධාරිතාවයකින් යුතුව ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |
| (ඌ)ජය ඉසුර ණය යෝජනා ක්‍රමය සඳහා වූ අවබෝධතා ගිවිසුමේ 13.4 ඡේදය ප්‍රකාරව ණය ඉල්ලුම්කරුවන්ගේ ව්‍යවසාය සංවර්ධනය පුහුණු ව්‍යාපෘතිය තුළ තාක්ෂණික පුහුණු ව්‍යාපාර, කළමනාකරණ පුහුණු සහ වෙනත් හඳුනාගත් පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා සම්බන්ධීකරණය කිරීම සිදුකළ යුතු වුවත් අධිකාරිය විසින් එම කටයුතු සිදු කර නොතිබුණි. | 2023 වර්ෂයේ පොල් තෙල් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අවස්ථාවේදී මෙම ණය යෝජනා ක්‍රමය පිළිබඳව හඳුන්වා දීමට කටයුතු කරන ලදි. ඊට අමතරව ප්‍රදර්ශන භූමිවල ප්‍රදර්ශන කුටි වලදීද මෙම ණය යෝජනා ක්‍රමය පිළිබඳව හඳුන්වා දීමට කටයුතු කරන ලදි . ඒ අනුව, රාජ්‍ය මුදල් කළමනාකරණය කිරීමට ගෙන ඇති තීරණය පරිදි කප්රුක ජය ඉසුර ණය යෝජනා ක්‍රමය පිළිබඳව වෙනම වැඩසටහන් ක්‍රියාත්මක කර නැත. | ගිවිසුම් ප්‍රකාරව ව්‍යවසාය සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය විධිමත් කළ යුතුය. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)පරිගණක ටැබ්ලට් 50ක් මිලදී ගැනීම සඳහා වූ ප්‍රසම්පාදනයේදී එක් ආයතනයකින් මුලදී රු.117,700 කට මිල ගණන් ලැබී පසුව එය නොසලකා නැවත මිල කැඳවා එම ආයතනයෙන්ම ටැබ්ලට් 46 ක් රු.150,800 කට මිලදී ගැනීමට කටයුතු කිරීමෙන් අධිකාරියට රු.1,522,600 ක මූල්‍ය පාඩුවක් සිදු වී තිබුණි. | 4GB RAM ධාරිතාවයකින් යුත් ටැබ් පරිගණකයක් සඳහා ඉදිරිපත්ව ඇති රු 117,700.00.ක මිල 6 ,GB RAM ධාරිතාව යුත් ටැබ් පරිගණක මිල දී ගැනීම සඳහා මිල ගණන් කැඳවන ලද අවස්ථාවේදී විකල්පයක් (option) ලෙස ඉදිරිපත්ව ඇති මිල ගණනක් වේ. දෙවන අවස්ථාවේදී 4GB RAM ධාරිතාවයකින් යුතු ටැබ් පරිගණක මිලදී ගැනීම් සඳහා මිල ගණන් කැඳවා ඇති අතර, එහිදී මිල ගණන් කැඳවීම් දෙකක් වන බැවින් පළමු මිල ගණන් කැඳවීමේදී ඉදිරිපත්ව ඇති මිල ගණන් දෙවන මිල කැඳවීමේදී අදාළ කර ගැනීමට හැකියාවක් නැත. | පූර්ව ප්‍රසම්පාදන සැලසුම් නිසි පරිදි සකස් කර අධිකාරියේ අවශ්‍යතාවයන්ට අනුකූලව මිල කැඳවීම් සිදු කර අස්ථිත්වයට වඩාත් වාසිදායකව ප්‍රසම්පාදන කටයුතු මෙහෙයවිය යුතුය. |
| (ආ)අධිකාරිය විසින් රු.1,103,915 කට මිලදී ගත් Lux meters 28 ක් හා JR Thermometers 27 ක් 2023 දෙසැම්බර් 8 සහ 2023 ඔක්තෝබර් මස 30 අධිකාරිය වෙත ලැබී තිබුණු නමුත් විගණිත දිනය වූ 2024 පෙබරවාරි 29 දින දක්වා එම උපකරණ සියල්ලම භාවිතයෙන් තොරව ගබඩාව තුළ තබා තිබීමෙන් වසරක වගකීම් කාලය නිෂ්කාර්යව ගෙවී යන බව විගණනයේදී නිරීක්ෂණය විය. | මේ වන විට මෙම භාණ්ඩ අදාළ කාර්යයක් සඳහා ක්ෂේත්‍ර නිලධාරීන්ට ලබා දී ඇත. | ප්‍රසම්පාදනය නිම කරන ලද උපකරණ අදාළ කාර්යයන්හි යෙදීවීමටත් අත්‍යවශ්‍යය නොවන මිලදී ගැනීම් සිදු නොකිරීමටත් පාලන අධිකාරිය විසින් කටයුතු කළ යුතුය. |
| (ඇ)අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මේ අයිතමයන් 02 ක් ක්‍රියාත්මක නොකර තාවකාලිකව අවලංගු කර තිබූ අතර ව්‍යාපෘතීන් 10 ක් සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි. ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීමේදී අදාළ කාර්යයන් ඉටු කර ගැනීමේ හැකියාව පිළිබඳ නිසි අධ්‍යානයක් සිදු කර නොමැති බව විගණනයේදී වැඩිදුරටත් නිරීක්ෂණය විය. | 2023 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ආරම්භ කිරීම සඳහා 2023.07.29 දින අනුමැතිය ලද අතර ඉන් අනතුරුව අනුමැතිය ලද කාර්යයන් ආරම්භ කරන ලදි. සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ කිරීමට අපොහොසත් වූ කාර්යයන් අතර Construction of Toilet for Workers හා Renovation of Toilets (3) for staff යන කාර්යයන් 02 ඉටු කිරීම සඳහා 2023.08.07 දින මිල ගණන් කැඳවා 2023.10.11 දින කොන්ත්‍රාත් ප්‍රධානය කර ඇත. මෙම කාල වකවානු වන විට ඉදිකිරීම් සිදුකරන දුන්කන්නාව ප්‍රදේශයට වර්ෂාව හේතුවෙන් ඉදිකිරීම් සිදු කිරීමට නොහැකි | කාලානුරූපීව හා කාර්යක්ෂමව ප්‍රසම්පාදන සැලසුම් සකස් කළ යුතු අතර ඒ සඳහා අවශ්‍ය සංශෝධනද සිදුකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | තත්ත්වයක් පැවතිණි. කාර්යය සාධන ඇපකර කාල දීර්ඝ කරමින් අදාළ කොන්ත්‍රාත් කටයුතු නිම කිරීම 2023.12.31 දිනට නොහැකි වී ඇත. | |
| (ඇ)රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 සහ 8.9.1 ඡේදයන්ට අනුකූල නොවන පරිදි 2023 දෙසැම්බර් 21 දින රු.8,040,715 ක ටැබ්ලට් පරිගණක, තමෝමීටර. ලක්ස් මීටර මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේදී කාර්ය සාධන ඇපකරයක් ලබාගෙන නොතිබුණු අතර සැපයුම්කාර සමාගම සමඟ ගිවිසුමක්ද අත්සන් කර නොතිබුණි. අධිකාරියේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා 2018 දෙසැම්බර් 28 හා 2019 නොවැම්බර් 3 කාලවලදී ටැබ්ලට් පරිගණක 41 ක් මිලදී ගෙන ඔවුන්ට ලබාදී තිබුණු අතර එම නිලධාරීන් වෙනුවෙන් වර්ෂ 4 ක් වැනි කාලයක් තුළ නැවතත් ටැබ්ලට් පරිගණක 46 ක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. | 2018 වර්ෂයේ ක්ෂේත්‍ර නිළධාරින් සඳහා ලබාගෙන ඇති ටැබ් පරිගණක 41 ක් 2019 වර්ෂයේ සිට වසර 05 ක් භාවිතා කරනු ලැබීය. Zoom තාක්ෂණය හා Whatsapp තාක්ෂණය භාවිත කරමින් ක්ෂේත්‍ර නිලධාරින් සැකසුම් සංවර්ධන අංශයේ ඉහළ කළමනාකාරීත්වය සම්බන්ධ කර ගන්නා අතර 2018 වර්ෂයේදී මිලදි ගනු ලැබූ ටැබ් පරිගණක භාවිතා කර මෙ වන විට ක්ෂේත්‍ර නිලධාරින් රාජකාරී කටයුතු සිදු කරනු ලබන අතර දත්ත පද්ධති සඳහා පිවිසීමේදී හා වෙනත් රාජකාරි කටයුතු සිදු කිරීමේදී වසර 05 ක් පමණ පැරණි ටැබ් පරිගණක භාවිතා කිරීම මඟින් කාර්යයන් ඉටුකිරීම කාර්යක්ෂමව සිදු කර ගැනීමට නොහැකිව ඇත. එසේම ටැබ් පරිගණක බොහොමයක් ක්‍රියා විරහිතව ඇත. | රාජ්‍ය මුදල් ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය කළ යුතු අතර ප්‍රසම්පාදන කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී විය යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)අධිකාරියේ වර්ග අඩි 1,162සමන්විත බිම් මහල යොදාගෙන ස්ථාපිත කළ ව්‍යාපාරික සේවා මධ්‍යස්ථානය මගින් දුරකථනය හරහා පාරිභෝගික ගැටළු විසඳීමට ඇමතුම් මධ්‍යස්ථාන ඒකකයක් , පාරිභෝගිකයන්ට වඩා හොඳ සේවාවක් ලබාදීමට දියමන්ති ,ප්ලැටිනම් ,රන් ,රිදී සාමාජික කාඩ්පත් හඳුන්වා දීම මගින් විදේශීය පාරිභෝගිකයන් හඳුනාගැනීමට පාරිභෝගික සත්කාර ඒකකයක් , අධිකාරිය විසින් දේශිය හා ජාත්‍යන්තර පොල් ආශ්‍රිත දත්ත පාරිභෝගිකයන්ට ලබා දීමට අළෙවිකරණ බුද්ධි ඒකකයක් , තත්ත්ව ආරක්ෂණ ,සැකසුම් සංවර්ධන හා අළෙවිකරණ අංශවල තොරතුරු ලබාදීම හා තොරතුරු රැස් කිරීමට තොරතුරු තාක්ෂණ ඒකකයක් හා මෙම මධ්‍යස්ථානයේ සියළුම ක්‍රියාකාරකම් | පොල් ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රයේ නියැලී සිටින පාර්ශවකරුවන්ට පහසු වන පරිදි සේවාවන් ලබාදීම සඳහා පොල් සංවර්ධන අධිකාරියේ කොටුව කාර්යාලයේ බිම් මහලේ ආරම්භ කරන ලද ව්‍යාපාරික සේවා මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ පොල් ආශ්‍රිත නිෂ්පාදන සහ අපනයන කරුවන්ගේ ප්‍රධාන කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියාකිරීමයි. පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තකරුවන්ට සහ අපනයනකරුවන්ට පොල් සංවර්ධන අධිකාරියේ සේවාවන් කඩිනම් සේවාවක් ලෙස ලබාදීමත්, ජාත්‍යන්තර වෙළඳපලේ ශ්‍රී ලංකාවේ පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා සුවිශේෂී සන්නාම නාමයක් | නිසි ශක්‍යතා අධ්‍යනයකින් පසුව පමණක් සැලසුම් සකස් කර එම සැලසුම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| සැලසුම් කිරීමට සැලසුම් ඒකකයක් ඇතුළුව ඒකක 5කින් මෙම මධ්‍යස්ථානයේ කටයුතු සිදු කිරීමට අධිකාරිය සැලසුම් කළ ද ඉහත කී කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂයේ සිදු කර නොතිබුණි . | ජාත්‍යන්තරව ලබාදීමත් මෙමගින් වැඩිදුරටත් බලාපොරොත්තු විය. නමුත් පවතින තත්ත්වය මත බොහෝ කර්මාන්තකරුවන් මාර්ගගත ක්‍රම ඔස්සේ තම සේවාවන් ලබාගැනීමට පෙලඹීම් මත මෙම මධ්‍යස්ථානයට පැමිණ ලබාගැනීමේ අඩුවක් දක්නට ඇත. | |
| (ආ)කොහු කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් 2006 වර්ෂයේදී දුන්කන්නාව කොහු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය ආරම්භකර තිබුණද 2023 වර්ෂයේ පුහුණු පාඨමාලාවන් එකක් හෝ පවත්වා නොතිබීම, කර්මාන්ත ශාලාවේ පවතින යන්ත්‍ර 18න් 14ක්ම අක්‍රිය තත්ත්වයේ පැවතීම හා ක්‍රියාකාරී මට්ටමේ පවතින යන්ත්‍ර ද අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින බැවින් පුහුණු මධ්‍යස්ථානය පිහිටු වීමේ අරමුණු ඉටු නොවන බවත් පවතින වත්කම් සියල්ල නිශ්කාර්යව දිරායමින් පවතින බවත් නිරීක්ෂණය විය. | දුන්කන්නාව කොහු සංවර්ධන සහ පුහුණු මධ්‍යස්ථානයේ යන්ත්‍ර සූත්‍ර නඩත්තු කර හෝ යල් පැනගිය යන්ත්‍ර ඉවත්කර නව යන්ත්‍ර සවිකර නැවත ක්‍රියාකාරී තත්වයට පත් කර ගැනීම සඳහා ඉතා විශාල වියදමක් දැරිය යුතු බැවින් සහ අධිකාරිය ආයතන සංග්‍රහය, මූල්‍ය සංග්‍රහයේ නීති රීති අනපනත් අනුව කටයුතු කරන බැවින් ඊට යටත්ව පවත්වාගෙන යාම ප්‍රයෝගික නොවන බැවින් පසුගියවර පැවති කෝප් කමිටුවේදී ලබා දුන් උපදෙස් ද අනුගත කරමින් පෞද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයේ ම මැදිහත් වීමෙන් (Public-Private Partnerships) මෙම කාර්ය සිදු කිරීම සඳහා කොහු කර්මාන්තයේ නියැලෙන්නන් සමඟ සාකච්ඡා කර ඉදිරි කටයුතු කරනු ඇත. | වත්කම් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස උපයෝජනය කර ගැනීමට අවශ්‍ය පියවර නොපමාව ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ)2023 වර්ෂයේ අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්මට අනුව අපනයන පුළුල් කිරීම, අපනයනය විවිධාංගිකරණය සඳහා පහසුකම් සැපයීම, නිෂ්පාදන ප්‍රමාණය සියයට 5 කින් පුළුල් කිරීම හා පොල් නිෂ්පාදන සම්බන්ධ සැකසුම් සංවර්ධන අංශයේ නියාමනයට අදාළ කාර්යයන් 6ක භෞතික ඉලක්ක 168 ක් පැවතුණද එම භෞතික ඉලක්ක 23 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. එසේම භෞතික ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රතිශතය සියයට 1 ත් 60 ත් අතර පරාසයක වී තිබුණි. | පොල් ආශ්‍රිත අපනයන ආරවුල් විසඳීම - අපනයනයන් සම්බන්ධ පැමිණිලි 06ක් පමණ ලැබෙනු ඇතැයි අපේක්ෂා කලද අපනයනයන් සම්බන්ධව 2023 වසරේදී අධිකාරිය වෙත ලැබුණුයේ එක් පැමිණිල්ලක් පමණි. අපනයන විවිධාංගීකරණය සඳහා පහසුකම් සැපයීම යටතේ සමීක්ෂණ 2ක් සිදුකිරිමට අපේක්ෂා කලද එක් සමීක්ෂණයක් 2023 වසරේදී සිදුකර අවසන් කර ඇත. P2 වැඩසටහන යටතේ පොල් ත්‍රිකෝණයෙන් බැහැරව නව කර්මාන්ත ඇති කිරීම යටතේ බාහිර | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසුව පමණක් සැලසුම් සකස්කර එම සැලසුම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ යුතුය. |

පාර්ශවයක් සමඟ සිදු කරන කාර්යක් වන අතර ව්‍යවසායකයින් ඒ පිළිබඳ ඉල්ලීමක් සිදුකළහොත්, අධිකාරිය විසින් ඒ පිළිබඳව අධ්‍යයනය කර කර්මාන්තය ආරම්භ කිරීම සඳහා අවසර ලබාදේ. 2023 වර්ෂයේ ගුණාත්මක පොල් තෙල් නිපදවීම සඳහා කර්මාන්තකරුවන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් 20 ක් වසර පුරා පැවැත්වීමට සැලසුම් කර තිබුණද එයින් 07ක් පමණක් පවත්වා ඇත.